**ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

**(අ) ඇස්තමේන්තු පිළියෙල කිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වැය විෂයයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.2,351,000 ක ප්‍රමාණයක් එනම් සියයට 4 සිට සියයට 492 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි. | දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර හේතු නිසා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා අමතර ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කර ගැනීමට සිදු වූ බව. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |
| (ii) | වැය විෂයයන් 03 ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය නොවීම හේතුවෙන් එකතුව රු.1,147,000 ක් සියයට 26 සිට සියයට 61 දක්වා වූ පරාසයකින් ප්‍රතිපාදන අඩුකර තිබුණි. | ඉතිරි වූ ප්‍රතිපාදන, දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැරව අනපේක්ෂිතව දැරීමට සිදු වූ වියදම් ආවරණය කර ගැනීම සඳහා මු.රෙ. 66 යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ප්‍රතිපාදන මාරු කර ගත් බව. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදිව හා තාත්ත්විකව පිළියෙල කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13 ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණ ද, ඉන් අරමුදල් 10 ක පැවති රු.1,769,698,149 ක මුදලක් භාණ්ඩාගාරය වෙත ලබා ගැනීමෙන් පසු එම අරමුදල් වසා දමා තිබුණු නමුත් අනෙකුත් අරමුදල් 3 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජාතික උද්භිද උද්‍යාන අරමුදල ස්වාධීන ආයතනයක් ලෙස නැවත ස්ථාපිත කිරීම සඳහා ඉල්ලීම් ලිපි වරින් වර ඉදිරිපත් වී ඇතත්, එළැඹී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළයුතු බව දැන්වීම, වාහන වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම, වැවිලි ස්වයං රැකියා චක්‍රීය අරමුදල වසා දැමීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු විම. |
| (ආ) | 2015 අයවැය යෝජනාවක් මත ආරම්භ කෙරුණු රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම හා සම්මත කර ගැනීමේ කාර්යයන් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිම වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | දැනටමත් කෙටුම්පත්කර ඇති රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත සඳහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු විසින් ලබාදි ඇති නිරීක්ෂණ/ යෝජනා වලට අනුව අවශ්‍ය සංශෝධන බොහොමයක් ඇතුළත්කර ඇති අතර, තවදුරටත් සාකච්ඡා කළ යුතු කරුණු පිළිබඳව අවධානය යොමු කොට, මෙම කාර්යය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගනිමින් අවශ්‍ය සංශෝධන සිදුකිරීම සඳහා අධීක්ෂණ කමිටුවක් (Supervisory Committee) සහ තාක්ෂණ කමිටුවක් (Technical Committee) පත් කිරීමට භාණ්ඩාගාර ලේකම් විසින් පත්කිරීමට කටයුතු කර ඇත. මේවන විටත්, අධීක්ෂණ කමිටු රැස්වීම් හා තාක්ෂණ කමිටු රැස්වීම් පවත්වා නීති කෙටුම්පත් සම්පාදක වෙත කෙටුම්පතක් යැවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | අයවැය යෝජනාවලින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 80 ක් වූ අතර, ඉන් තනතුරු 14 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටම තනතුරු 07 ක් ද තෘතියික මටට්ටමේ තනතුරු 01 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 04 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද විය. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර නිශ්චිත කාර්යමණ්ඩල සමාලෝචනයකින් අනතුරුව නිවැරදි කාර්යමණ්ඩල ප්‍රතිසංස්කරණයක් මඟින් ප්‍රශස්ත කාර්යමණ්ඩලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | විධිමත් පරිදි කටයුතු කර එම පුරප්පාඩු පිරවීම හෝ එලෙස බලපෑමක් ඇති නොවේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |